

වසර 32ක් යනතුරුත් නොවිසඳුණු

# ජනරජ ලාංඡන අවුල

ප්‍රියන්ත ප්‍රදීප් රණසිංහ

**ඔහු කියන පරිදි ජනරජ ලාංඡනය නිර්මාණය සම්බන්ධයෙන් පූජ්‍ය මාපලගම විපුලසාර හිමියන් මෙන්ම එස්.එම් සෙනෙවිරත්න ද එක සේ ගෞරව ලැබිය යුතුය.**





මේ මැයි 22 වන දායින් පසු ගෙවී යන්නේ ශ්‍රී ලංකාවේ ජනරජයක් බවට පත්වීමෙන් පසු එළඹෙන තිස්දෙවන වසරයි. ජනරජයක් ලෙස ශ්‍රී ලංකාව යළි උපන්නේ 1972 මැයි 22 වනදාය. ජනරජයක් බවට පත් වීමෙන් පසු යටත් විජිතයක් ලෙස බ්‍රිතාන්‍යයත් සමඟ පැවති සියලු බැම්වලින් ශ්‍රී ලංකාව නිදහස් වූවාය. අප සැබෑ නිදහස ලැබුවේ 1972 මැයි 22 වන දා යැයි එදා පාලකයන් මොර ගැවේ ඒ නිසාය. එය ඇත්තය.

ඒ අනුව එදා සිට පෙබරවාරි 04 වනදා, නිදහස් දිනය සැමරුවේ නැත. මැයි 22 ජනරජ දිනය සැමරීය. පෙබරවාරි 04 වනදා ජාතික වීර දිනය විය.

එහෙත් ජනරජ දිනයට වැඩි ආයුෂක් තිබුණේ නැත. 1977 බලයට පත්වූ එජාපය ජනරජ දිනය පසෙකට විසි කර පෙබරවාරි 04 නිදහස් දිනය යළිත් සමරන්නට පටන් ගත්තේය.

එහෙත් කුමන හේතුවක් නිසා හෝ ජේ.ආර් ජයවර්ධන එකවර ම මැයි 22 ජනතාවට අමතක කරවූයේ නැත. ජයවර්ධන ආණ්ඩුව මැයි 22ට ජාතික වීර දිනය යැයි නම් තැබීය. සිරිමා බණ්ඩාරනායකගේ ජනරජ දිනය ජේ.ආර් ජයවර්ධනගේ ජාතික වීර දිනය වූයේත් සිරිමා බණ්ඩාරනායකගේ ජාතික වීර දිනය ජේ.ආර් ජයවර්ධනගේ නිදහස් දිනය වූයේත් ඒ අයුරිනි.

එහෙත් මහා කපටි මොළයක් ඇතැයි ප්‍රසිද්ධියට පත් ජේ.ආර්ට එක් දෙයක් අමතක විය. ජනරජ දිනය ජාතික වීර දිනය බවට පත් වන විට ශ්‍රී ලංකාව ජනරජයක් බවට පත් කළවුන් ජාතික වීරයන් වූ බවය. මේ බව මොහොතකටවත් ජේ.ආර්ට මතක් වූවානම් මැයි 22 කවරදාවත් ජාතික වීර දිනය වන්නේ නැත. අඩුම ගණනේ මැයි 23වත් ජාතික වීර දිනය වනු ඇත.

ඒ, එක් එක් පාලකයාගේ වීරකම්ය. එහෙත් 1972 දී ජනරජයක් ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ම ජාතික කොඩියත්, රාජ්‍ය ලාංඡනයත් අලුතින් එළි දැක්විය යුතු යැයි අදහසක් පළ කළේ අගමැතිනි සිරිමා බණ්ඩාරනායකමය. ජනරජ ගීතය පවා අලුතින් නිර්මාණය කිරීමට ගීත රචකයන්ට අවස්ථාව උදා වූයේ ඒ අයුරිනි.

මහගමසේකර ද ජනරජ ගීයක් නිර්මාණය කළේය. එම ගීය ජනරජ ගීය ලෙස තෝරා ගැනීමට සළකා බැලීම පිණිස කැඳවීමක් ලැබිණි. එහි දී ජනරජ ගීතය සම්බන්ධයෙන් ක්‍රියා කළ කමිටුවේ තීරණය වූයේ එය ජනරජ ගීතය ලෙස නොගැලපෙන බවයි. මෙම ගීයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කරුණු නොකියවීම ඊට හේතුවයි. ඔවුන් සේකරයන්ගෙන් ඉල්ලා සිටියේ හැකිනම් එම කරුණු අඩංගු වන සේ ගීතය වෙනස් කරන ලෙසයි.

'ඒක ඉතා ලේසි වැඩක්' සේකරගේ අදහස විය.

'ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට තනුවක් දාගන්න'

ඉන්පසු ශ්‍රී ලංකාව ජනරජයක් වී විසිනව වසරක් ගතවීත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට තනුවක් යොදා ගයන්නට කිසිදු ආණ්ඩුවක් ඉදිරිපත් වූයේ නැත. ඒ ජනරජ ගීයේ කතාවය. එහෙත් මේ ජනරජ දිනයක් නිසා සිදු වූ අවුල් වියවුල් ඊට වඩා වැඩිය. ඇතැම් අවුල් අදට ද අවුල්ය. ඇතැම් විට වියවුල්ය. මේ අතරින් ලොකුම අවුල ජනරජ ලාංඡන අවුලය.

ජනරජ ලාංඡනය නිර්මාණය කළ ශිල්පියා කවුරුන් ද යන්න පවා තවමත් පැහැදිළි නැත්තේ ඒ නිසාය. එහෙත් කොළඹ රාජ්‍ය ලේඛණාගාරයේ තැන්පත් කොට ඇති ශ්‍රී ලංකා ජනරජ ලාංඡනයේ මුල් පිටපතේ, නිර්මාණකරුවා ලෙස සටහන් කොට ඇත්තේ එස්.එම් සෙනෙවිරත්න නමැති මහතකුගේ නමය.

සෙනෙවිරත්න මහතා එදා තිබුණු පුරා විද්‍යා දෙපාර්තමේන්තුවේ සැලසුම් ශිල්පියෙක් විය. ඔහු සැලසුම් ශිල්පය ගැන විශාල අත්දැකීම් ඇත්තෙකි. ඒ වගේම දක්ෂ නිර්මාණ ශිල්පියෙකි. ඓතිහාසික විහාර දේවාල විශාල ප්‍රමාණයක ඉපැරණි කැටයම් කෙටුම්පත් කොට ඇත්තෙකි.

කොහොම වෙතත් 1972 දී ජනරජය ප්‍රකාශයට පත්කිරීමේ මූලික කටයුතුවලින් වැඩි වගකීම් ප්‍රමාණයක් පැවරී තිබුණේ සංස්කෘතික කටයුතු අමාත්‍යංශයටය. එදා එම අමාත්‍යාංශයේ ස්ථිර ලේකම්වරයා වූයේ නිශ්ශංක විජේරත්න මහතාය. ජනරජ ලාංඡනයේ නිර්මාණකරුවා පිළිබඳ අවුල පැන නැගි සෑම මොහොතකම ඔහු එක හෙළාම ප්‍රකාශ කරන්නේ එය ගරු මාපලගම විපුලසාර ස්වාමීන් වහන්සේගේ නිර්මාණයක් බවය.

නිශ්ශංක විජේරත්න මහතා කියන විදියට එදා ශ්‍රී ලංකාව ජනරජය ලෙස ප්‍රකාශයට පත් කිරීමට පළමු, අවසන් කැබිනට් රැස්වීම පැවතියේ 1972 මැයි 12 වැනිදාය. එහිදී වූ සාකච්ඡාවලින් අනතුරුව ජනරජ ලාංඡනය නිර්මාණය කරවීම සම්බන්ධ වගකීම පැවරුණේ ඔහුටමය. ඒ වගකීම ඉටු කිරීමට එකම සුදුසු'සා වශයෙන් ඔහු සැලකුයේ කලාශූරී මාපලගම විපුලසාර හිමියන්වය. ඒ අනුව විපුලසාර හිමියන් ද වැඩමවාගෙන අගමැතිනි සිරිමා බණ්ඩාරනායක වෙත ඔහු ගියේ අගමැතිවරියගේ අදහස ද උන්වහන්සේ වෙත දන්න ගන්නට සැලැස්වීමටය.

'එදා ම පැය බාගයක් තුළ දී එවකට පාවිච්චි කළ සිංහල ඔටුන්න, කඩුව අතින් ගත් සිංහ රූපය සහිත රාජ්‍ය ලාංඡනය ගැන ද සලකා සිංහ රූපය පමණක් ගෙන දැනට පාවිච්චි කරන ධර්ම චක්‍රය, පුන්කලස, ඉර, හඳ, වී කරල් සහ නෙළුම් මල් සහිතව එම ලාංඡනය නිර්මාණය කර පෙන්නුවා. ගරු අගමැතිනිය එවලේම ආණ්ඩුවේ අනිකුත් දේශපාලන පක්ෂ වූ සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ නායකයන්ට ද කතා කළා. පසුව ඒ අයගේ ඒකමතික කැමැත්තත් ලබාගෙන වහා එම නිර්මාණය මුද්‍රණය කිරීමට සුදුසු පරිදි චිත්‍ර කිරීම අවශ්‍ය වුණා. ගරු විපුලසාර හිමියන්ගේ උපදෙස් පරිදි ම පුරාවිදු දෙපාර්තමේන්තුවට ගොස් චිත්‍රකරණ කාමරයේ දී එහි ප්‍රධානී රෝලන්ඩ් සිල්වා මහතාට කීවා, මේ චිත්‍රය මුද්‍රණය සුදුසු පරිදි වහා සකස් කර ගත යුතුයි කියා. ඔහු ඔහුගේ කාර්ය මණ්ඩලයේ අය ලවා ඉක්මණට එය නිම කර දුන්නා. ඒ අවස්ථාවේ එහි සිටි කලාවේදී එච්.ආර් ප්‍රේමරත්න මහතාත් පුරාවිදු උප කොමසාරිස් රෝලන්ඩ් සිල්වා මහතාත් මේ නිර්මාණය ගැන අගය කළා'

මේ වචන කියන්නේ නිශ්ශංක විජේරත්නමය. මේ අනුව වර්තමාන ජනරජ ලාංඡනය නිර්මාණය කිරීමේ ගෞරවය පූජ්‍ය මාපලගම විපුලසාර හිමියන්ගෙන් පිටට යනවාට ඔහු කැමති නැත.

1972 දී ජනරජයක් ප්‍රකාශයට පත් කිරීමේ මූලික කටයුතු අතර ජනරජ ලාංඡනය, ජාතික කොඩිය, ප්‍රශස්තිය සකස් කිරීම, කලා ප්‍රදර්ශන, සංස්කෘතික ප්‍රදර්ශන, ප්‍රධාන උත්සව වේදිකාව සැකසීම ආදිය මුල් තැනක් ගෙන තිබුණි. මේ සියල්ලක්ම අදාළ ප්‍රවීණයන් ලවා කරවා ගැනීමේ දී සම්බන්ධීකරණ නිලධාරියා ලෙස කටයුතු කළ අයෙක් විය. ඔහු සංස්කෘතික අමාත්‍යංශයේ නිමල් කේ. පතිරණය.

ඔහු කියන පරිදි ජනරජ ලාංඡනය නිර්මාණය සම්බන්ධයෙන් පූජ්‍ය මාපලගම විපුලසාර හිමියන් මෙන්ම එස්.එම් සෙනෙවිරත්න ද එක සේ ගෞරව ලැබිය යුතුය.

ජනරජය ප්‍රකාශයට පත් කිරීමත් සමඟ ම ජාතික කොඩියත්, රාජ්‍ය ලාංඡනයත් අලුතින් සකස් වී එළි දැක්විය යුතු බව අගමැතිනිය සිරිමා බණ්ඩාරනායක කල්පනා කොට ඇත. එය සම්පූර්ණ විය යුත්තේ විපුලසාර හිමියන් මඟින් බව ද ඈ විශ්වාස කළාය.

කෙසේ වෙතත් සිද්ධි පෙළ ගැසුණු අයුරු නිමල් කේ. පතිරණගේ වචනවලින් ම දැන ගැනීම වඩා යෝග්‍යය.

'මේ පිළිබඳව සැලැස්මක් පිළියෙළ කරන ලෙස නිශ්ශංක විජේරත්න මහතා, සෙනෙවිරත්න මහතාට පවරන අවස්ථාවේ මමත් හිටියා. විපුලසාර හිමියනුත් විජේරත්න මහතාත් අතර ඒ ගැන මොන දේවල් කතාබහ වුණාදැයි මම දන්නේ නෑ. සෙනෙවිරත්න මහතා සැලසුම පිළියෙළ කරගෙන ගියා. ඒ ගැන ඔහු කීපවරක්ම ලේකම්තුමාව ද හමුවුණා. විපුලසාර හිමියොත් නිතර නිතර ලේකම්තුමා බැහැ දුටුවා. මේ තුන්දෙනා ම එකට හමු වූ අවස්ථාත් තිබුණා. මේ හින්දා ජනරජ ලාංඡනයේ මූලික සටහන් කාගේ ද කියා මට කිව නොහැකියි.... මා දැන සිටි අන්දමට සෙනෙවිරත්න මහතා ලාංඡනය පිළියෙළ කරමින් සිටියා. විපුලසාර හිමියෝ එයට උපදෙස් දෙමින් ජාතික කොඩියේ කටයුතු කරගෙන ගියා. මගේ මතකයේ හැටියට සෙනෙවිරත්න මහතාගේ ලාංඡන සැකසුමේත්, අනුමත රාජ්‍ය සැලැස්මේත්, අනුමත රාජ්‍ය ලාංඡනයේත් ලොකු වෙනසක් නැහැ'

මේ අනුව නිමල් කේ. පතිරණ කියන්නේ මෙකී ශ්‍රේෂ්ඨ කාර්යයට මේ දෙපළම සම්බන්ධ බවය. මෙ නිසා එහි ගෞරවය ඒ දෙපළටම හිමි විය යුතු බවය.

ජනරජ ලාංඡනය කාගේ නිර්මාණයක් වුවත් එය තොරණක් ලෙස හැඳින්වූ අය ද වූහ. ඒ අතරින් ප්‍රධාන තැනක් ගන්නේ සිසිර කුමාර මාණික්කආරච්චිය. ඔහුට මේ බව පෙනී ඇත්තේ 1973 තරම් ඈත කාලයේ දීය.

ඔහුගේ අදහස අනුව රාජ්‍ය ලාංඡනයක ඉර සහ හඳ පොළොවේ අත්තිවාරම අල්ලා සාදා ඇත්තේ ශ්‍රී ලංකාවේ පමණය. මෙරට පැරණි කොඩිවලවත් රාජ්‍ය ලාංඡනවලවත් එවැනි විස්කමක් නැහැ. ඒ අනුව ඉර හඳ ඇතුළත් වන කුණ්ඩසාලේ ඉර හඳ සිංහ කොඩියේවත්, කෑගල්ලේ හතර කෝරළේ දිසා කොඩියේවත්, කුණ්ඩසාලේ ගුරුළු කොඩියේවත්, කුණ්ඩසාලේ මහසෙන් සැවුල් කොඩියේවත් මහනුවර ඌව දිසාවේ කොඩියේවත් ඉර හඳ පුටු කකුල්වලට සවි කොට නිර්මාණය කොට නැත.

ඒ වගේම රාජ්‍ය ලාංඡනයේ හඳේ ඇති රූපය තුළින් ඔහුට පෙනෙන්නේ එකල ශ්‍රී ලංකා

7 වන පිටට